# ඡන්ද විමසීම් රාජකාරීවල නිරත කරවන රියදුරන් සඳහා උපදෙස්.

1. 2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ගේ ඉල්ලීම මත කොළඹ සංචිතයෙන් වාහන ලබාදීමට කටයුතු කරනු ලබයි.

2. ඡන්ද විමසීම් රාජකාරී සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙත වාහන නිදහස් කළ විට එම වාහන හා රියදුරන් මැතිවරණ කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙක් යටතට පත්වනු ඇත. ඡන්ද විමසීම් රාජකාරී වලින් නිදහස් කරන තෙක් මෙම නියමය බල පැවැත්වෙන අතර, එම රියදුරන් මැතිවරණ කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරීගේ නියෝග වලට අවනත විය යුතුය.

3. ඡන්ද විමසීම් සඳහා නිදහස් කරනු ලබන වාහන වල රියදුරන් විසින් එම රාජකාරී සඳහා පිටත් වීමට ප්‍රථම වාහනයේ ධාවන තත්වය පිළිබඳ පරීක්ෂාකර සහතික විය යුතුය.

4. මැතිවරණ රාජකාරී සඳහා තම නිත්‍ය සේවා ස්ථානයෙන් වාහනය පිටත්වීමට පෙර වාහනය අයත් ආයතනය වෙනුවෙන් කරන ලද ධාවනය කිරීම්, ධාවන සටහනෙහි ඇතුළත් කර ධාවන සටහන තුලනය කර ඉතිරි ඉන්ධන ප්‍රමාණය අනුව ඡන්ද විමසීම සඳහා වාර්තා කළයුතු ස්ථානයට යාමට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය පමණක් වාහනය අයත් ආයතනයෙන් ලබාගත යුතුය. එසේ ලබාදෙන ඉන්ධන සඳහා වැයවන වියදම ඡන්ද විමසීමෙන් පසුව අදාළ ආයතනය වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

5. දින කිහිපයක් තම ස්ථිර වාසස්ථානයෙන් බැහැරව රාජකාරියෙහි යෙදීමට සිදුවන බැවින්, එම දින කිහිපය සඳහා අවශ්‍ය වන පෞද්ගලික බඩුබාහිරාදිය (බෙහෙත්, ඇඳුම්, සබන්, දත්බෙහෙත් හා ඇතිරිලි) රැගෙන යා යුතුය.

6. ඡන්ද විමසීම් රාජකාරී සඳහා නිදහස් කළ පසු එම රාජකාරිවල නිරතව අවසානයේ සිය නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කරන තෙක් කාලය තුළ සිදුවන අනතුරු ආපදා ආදිය නොපමාව තම ආයතන ප්‍රධානියා වෙත හා ඡන්ද විමසීම් සඳහා අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. එසේම කොළඹ සංචිතයෙන් මුදාහල වාහනයක් නම් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය වෙත ද දැනුම් දිය යුතුය. ඔවුන්ගේ උපදෙස් මත අළුත්වැඩියාව හෝ ඉදිරි කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් ඡන්ද විමසීම් රාජකාරීන්හි ඔබ යෙදෙන අවස්ථාවන්හි වුවද මෝටර් රථ ආඥා පණතේ හා සිවිල් නීතියේ නියමයන්ට යටත් විය යුතුය. එම නිසා හදිසි අනතුරකදී නොපමාව ළඟම ඇති පොලිස් ස්ථානයට දැනුම් දීම ද අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය.

7. ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදා ගනු ලබන වාහනවල නීති විරෝධී භාණ්ඩ පැටවීම හෝ ප්‍රවාහනය කිරීම සිදු නොකළ යුතුය. එසේම ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවන ලද නිලධාරීන් හැර වෙනත් අය ප්‍රවාහනය නොකළ යුතුය. ගමන් කිරීමට උපදෙස් දී ඇති ස්ථානයට ඉතාම කෙටි ප්‍රධාන පාර භාවිතාකර නොපමාව වාර්තා කළයුතුය. මාර්ග අවහිරතාවක් වැනි විශේෂ අවස්ථාවකදී හැර වෙනත් විකල්ප මාර්ග හෝ අතිරේක ගමන් යොදා නොගත යුතුය.

8. කොළඹ සංචිතයෙන් පිට පළාත් සඳහා යවනු ලබන වාහන ඡන්ද විමසීම් රාජකාරී අවසන්වී ආපසු පැමිණීමේදී එම දිස්ත්‍රික්කයන්හි ප්‍රවාහන නිලධාරීන්ගේ උපදෙස් පරිදි ඡන්ද විමසීම් රාජකාරීවල යෙදුනු නිලධාරීන් ප්‍රවාහනය කිරීම සිදු කළයුතුය. වෙනත් පුද්ගලයින් කිසිවෙකු හෝ ඡන්ද විමසීම් රාජකාරීවල නිරත වන මුළු කාලය තුළදී වාහනයට ගොඩනංවා ගැනීමක් නොකළ යුතුය.

9. ඡන්ද විමසීම් රාජකාරි සඳහා නිදහස් කළ අවස්ථාවේ සිට ආපසු පැමිණ නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කරන තෙක් සියළුම රියදුරන් මැතිවරණ රාජකාරීහි යෙදී සිටින කාලය වශයෙන් සලකනු ලැබේ. එම නිසා එම කාලය තුළ සාමාන්‍ය රාජකාරියේ යෙදී සිටීමේදී බල පැවැත්වෙන සියළුම කොන්දේසි හා නියමයන් බල පැවැත්වේ. විශේෂයෙන් බීමත්ව රිය පැදවීම හෝ බීමත්ව සිටීම, අවිනීතව හැසිරීම පිළිබඳව ඉතාමත් සුපරීක්ෂාකාරී වනු ඇත.

10. කිසියම් රියදුරෙකු බීමත්ව සිටින බව දැනගන්නට ලැබුනහොත් ඔහු රැගෙන ආ වාහනය සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) භාරයට ගනු ලබන අතර කිසිඳු හේතුවක් නිසා එය ඔහුට ආපසු භාර නොදෙනු ඇත. මේ පිළිබඳව වාහනය අයත් ආයතනයට දන්වා එය රැගෙන යාමට වෙනත් රියදුරෙකු එවන ලෙස දන්වා සිටිනු ඇත.

11. ඡන්ද විමසීම් රාජකාරීහි යෙදෙන සියළුම කාලය සඳහා යැපීම් දීමනා ගෙවනු ඇත. මෙම දීමනා ගෙවනුයේ ඔබගේ ආහාර පාන සඳහාය.

12. සියළුම රියදුරන් විසින් "සංචිත වාහන ඡන්ද විමසීම් රාජකාරී සඳහා යෙදවීම් විස්තර පත්‍රිකාව" (V-7) යන පෝරමයේ පිටපත් දෙකක් නිත්‍ය සේවා ස්ථානයෙන් සම්පූර්ණ කරවාගෙන ඡන්ද විමසීම් රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදී ඔහුගෙන් "ආ" කොටස සම්පූර්ණ කරවාගෙන එක් පිටපතක් ආපසු ගෙනවිත් නිත්‍ය සේවා ස්ථානයේ අදාළ බලධාරියාට භාරදිය යුතුය. එම විස්තර ඔබගේ අතිකාල දීමනා හා සංයුක්ත දීමනා ගෙවීමේදී අනිවාර්යයෙන්ම ඔබගේ නිත්‍ය සේවා ස්ථානයට ලැබී තිබිය යුතුය.

13. ඉහත 12 වන ඡේදයේ සඳහන් පෝරමයට අමතරව ඡන්ද විමසීම් රාජකාරි නිමවී අදාළ දිස්ත්‍රික්කයෙන් පිටත්වීමට ප්‍රථම ඡන්ද විමසීම් <u>රාජකාරීහි යෙදුන බවට පැමිණීමේ සහතිකය (CE 51 පත්‍රිකාව) සහකාර තේරීම්භාර නිලධාරි (ප්‍රවාහන) වෙතින් ලබාගත යුතුය.</u> ගෙවීම් කිරීම සඳහා එම පැමිණීමේ සහතිකය, අතිකාල / සංයුක්ත දීමනා ඉල්ලුම්පතට අමුණා ඉදිරිපත් කළයුතුය.

14. ඔබගේ වාහනයට අදාළ ධාවන සටහනද මැතිවරණ රාජකාරීවල යෙදුනු කිලෝ මීටර් ප්‍රමාණයන් හා ලබාගත් ඉන්ධන ප්‍රමාණයන් ඇතුළත් කර තුලනය කර සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) හෝ වෙනත් බලයලත් නිලධාරියෙකුගේ අත්සන හා මුද්‍රාව තබා සහතික කර ගන්න.

15. තවද කොවිඩ් වසංගත තත්වය තුළ මැතිවරණය පැවැත්වීම සම්බන්ධව ගත යුතු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රියා මාර්ග පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීමට සියළුම මැතිවරණ කාර්ය මණ්ඩලය බැඳී සිටින බැවින් ඔබ ද අදාළ තේරීම් භාර නිලධාරි / සහකාර තේරීම් භාර නිලධාරි විසින් ලබා දෙන එකී උපදෙස් ද තරයේ පිළිපැදීමට කටයුතු කළ යුතුය.

**සමන් ශ්‍රී රත්නායක,**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2020.07.09

# <u>සංචිත වාහන ඡන්ද විමසීම් රාජකාරී සඳහා යෙදවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව.</u>

වාහනය අයත් ආයතනයේ ප්‍රවාහන නිලධාරී විසින් පිටපත් 03 කින් සම්පූර්ණ කර පිටපත් දෙකක් අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදීමට රියදුරුට භාරදෙන්න. තුන්වන පිටපත වාහනය අයත් ආයතනයේ කාර්යාල පිටපත වශයෙන් තබාගන්න.

| | |
|---|---|
| 1. වාහනය අයත් දෙපාර්තමේන්තුව /අමාත්‍යාංශය / සංස්ථාව: | 2. වාහන අංකය |
| 3. රියදුරුගේනම : | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. වාහනයේ වර්ගය (අදාළ කොටුවල x ලකුණ යොදන්න.) | | | | | | | | 5. යොදන ලද ඉන්ධන වර්ගය (අදාල කොටුවල x ලකුණ යොදන්න.) | | | | 6. ඉන්ධන ටැංකියේ ධාරිතාව | 7. ඉන්ධන ලීටර් 1 ට ධාවනය වන කි.මී. ගණන | |
| ජීප් | | කැබ් | | වෑන් | | කාර් | | පෙට්‍රල් | | ඩීසල් | | ලීටර් | කි.මී. | |

| | | |
|---|---|---|
| 8. ඡන්ද විමසීම් සඳහා අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කය | 10. ඔබගේ ආයතනයෙන් ලබාදුන් ඉන්ධන ප්‍රමාණය ලීටර් : | 11. වාහනය පිටත් වන අවස්ථාවේ මයිලෝ මීටරයේ කියවීම : |
| 9. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාහනය නිදහස් කළ දිනය හා වේලාව : | 12. සහතික කරන නිලධාරියාගේ අත්සන හා මුද්‍රාව : | |

| | | | | |
|---|---|---|---|---|
| 2020 | 08 | | පෙ.ව | ප.ව |

"ආ" කොටස

අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ ප්‍රයෝජනය සඳහා

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. ඉහත වාහනය වාර්තා කළ දිනය හා වේලාව | 2020 | 08 | | පෙ.ව | ප.ව |
| 2. වාහනය දිස්ත්‍රික්කයට වාර්තා කළ අවස්ථාවේ මයිලෝ මීටරය කියවීම | | | | | |

| | | |
|---|---|---|
| 3. ඡන්ද විමසීම් සඳහා වාහනය යෙදවූ රාජකාරිය (අදාළ කොටුවල x ලකුණ යොදන්න.) | ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය | |
| | කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් ප්‍රවාහනය | |
| | වෙනත් | |

| | | | |
|---|---|---|---|
| 4. දිස්ත්‍රික්කය තුළ ධාවනයට ලබාදුන් ඉන්ධන ප්‍රමාණය (ලීටර්) | | 5. දිස්ත්‍රික්කය තුළ ධාවනය කර ඇති කි.මී.ප්‍රමාණය | |
| 6. ආපසු කාර්යාලයට යාමට ලබාදුන් ඉන්ධන ප්‍රමාණය (ලීටර්) | | 7. ආපසු කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය දළ වශයෙන් කි.මී. | |
| 8. ලබාදුන් මුළු ඉන්ධන ප්‍රමාණය ලීටර් | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. වාහනය දිස්ත්‍රික්කයෙන් නිදහස් කළ දිනය හා වේලාව | 2020 | 08 | | පෙ.ව. | ප.ව. |
| 10. වාහනය නිදහස් කරන අවස්ථාවේ මයිලෝ මීටරයේ කියවීම. | | | | | |

දිනය : 2020.08.

.....................................................................

සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)

**සහකාර තේරීම භාර නිලධාරී (ප්‍රවාහන)** :- ඡන්ද විමසීම් රාජකාරී අවසානයේ ***<u>මුල් පිටපතේ "ආ" කොටස සම්පූර්ණ කර ආපසු රැගෙන යාම සඳහා රියදුරුට භාර දෙන්න</u>***. රියදුරු මහතාගේ ගමන් වියදම් අයදුම්පත සමග මුල් පිටපත අමුණා ඉදිරිපත් කළ යුතු අතර එහි ඡායා පිටපතක් ඉන්ධන ප්‍රතිපූරණය කිරීමේ ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.